
8 වැනි සැසිය

**අපගේ පරිවර්තන ගමන**

# ඉදිරිපත් කිරීම සඳහා කථන පිටපත


ඉදිරිපත් කිරීම සඳහා කථන පිටපත

අපගේ පරිවර්තන ගමන – ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම සඳහා දෘශ්‍ය මෙවලමක්


THE LOCAL CHANGEMAKERS COURSE

# ඉදිරිපත් කිරීම සඳහා කථන පිටපත

## අපගේ පරිවර්තන ගමන – ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම සඳහා දෘශ්‍ය මෙවලමක්

*8 වැනි සැසියෙහි ඉදිරිපත් කිරීම සඳහා වන මෙම ලිඛිත පිටපත සැසියේ පවර්පොයින්ට් ඉදිරිපත් කිරීමෙහි අංක 3 සිට 24 දක්වා වන ස්ලයිඩ මගින් නිරූපණය කරනු ලැබේ.*

### ක්‍රියාකාරී සැලැස්මක් යනු කුමක්ද? එය වැදගත් වන්නේ ඇයි?




ක්‍රියාකාරී සැලැස්මක් යනු කුමක්ද සහ එය වැදගත් වන්නේ ඇයි? ක්‍රියාකාරී සැලැස්මක් යනු අපි සිටින තැනින් අපිට යාමට අවශ්‍ය තැනට යන්නේ කොහොමද කියන කාරණය යි.

අපි දීර්ඝ ගමනක් යන්නේ නම්, අපි ගමන් කරන්නේ කොහොමද කියා සැලැස්මක් සහ මාර්ග සිතියමක් තියෙනවා නම් හොඳයි. සමහර විට අපි බස් නැවතුම වෙත පයින් ඇවිද ගොස්, බස් රථයෙන් දුම්රිය ස්ථානයට ගොස්, එතැන් සිට දුම් රියෙන් ගමන් කර, ගමනේ අවසාන කොටස කුලී රියකින් යනවා වෙන්නට පුළුවන්. අපි සිතියමක් සහ සැලැස්මක් නැතිව ගිය හොත් අපිට මේ ගමනේ ගමනාන්තයට යන්නට නොහැකි වෙන්නට ඉඩ තිබෙනවා, නැතිනම් ඒ සඳහා වැඩි කාලයක් ගතවිය හැකියි.



ක්‍රියාකාරී සැලැස්මක් කියන්නෙත් සිතියමක් සහ ගමන් සැලැස්මක් වගේ දෙයක් – එය අපේ අරමුණ වෙත ගමන් කිරීම සඳහා අපි අනුගමනය කිරීමට සැලසුම් කරන පියවර සිතියම්ගත කර, අපිට උපාය මාර්ගිකව සහ කල්පනාකාරීව කටයුතු කිරීමට උපකාරී වෙනවා.

අපි හැමෝම ක්‍රියාකාරී සැලසුම් හදනවා. සමහර සැලසුම් හරිම සරලයි, ඒවා ඉබේම වාගේ අපගේ මනසේ ඇඳෙනවා. ඒවා අපේ මතකයේ රැඳී තිබෙනවා. නමුත්, සංකීර්ණ ප්‍රශ්න වලදී, ඒ කියන්නෙ අපි කලින් නොකළ දෙයක් කරන විට සහ කණ්ඩායමක් ලෙස එකට එකතු වී වැඩ කරන විට, අපි එයට වඩා සැලකිලිමත්ව සියලු දෙනාට ම මතක තබා ගත හැකි විදියට සැලැස්ම ලියා ගැනීම වැදගත් වෙනවා.




මෙම ඉදිරිපත් කිරීමේ ඉතිරි කොටසේ දී අපි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ගැනීම සඳහා 'අපගේ පරිවර්තන ගමන' නැමති සරල දෘශ්‍ය මෙවලම භාවිතා කරන ආකාරය ඉගෙන ගැනීමටයි අපි සූදානම් වෙන්නෙ.

### ගමන් කරන්නෝ





අපි පරිවර්තනයක් ඇතිකරන ගමනක් යාම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සාදා ගැනීමේ දී ඇතිවන පළමු ප්‍රශ්නය තමයි 'අපි කවුද' කියන ප්‍රශ්නය.

පරිවර්තනයක් ඇති කිරීමේ ගමනක යෙදෙන මේ අය කවුද? සමහර අය පයින් ඇවිද යද්දී සමහර අය මෝටර් රථයක නැති නම් ගුවන් යානයක ගමන් කරන්නා වාගේ පුද්ගලයින්, සංවිධාන සහ කණ්ඩායම් වශයෙන් අපට තිබෙන අවස්ථා, අපේ ශක්තීන් සහ දුර්වලතා විවිධාකාරයි; අපි මුහුණ දෙන අවදානම් විවිධාකාරයි.
'අපි කවුද?' කියා අසමින් ආරම්භ කිරීම මෙම කරුණු සිතේ තබාගන්න අපට උපකාරී වෙනවා.





අපි පරිවර්තනය සඳහා යන ගමනක් සිතින් මවාගෙන, අපි අපේ නගරයේ ජීවත් වන විවිධ ආගම්වලට අයත් තරුණ මිතුරු පිරිසක් යැයි සිතමු.

### අපේ ආරම්භක ස්ථානය





අපි ගමනක් යාමට සැලසුම් කරද්දී, මුලින් ම දැනගත යුතු දේ අපේ ගමනේ ආරම්භක ස්ථානය යි. පරිවර්තනයක් සඳහා යන ගමනක් ආරම්භ වෙන්නේ ප්‍රශ්නයක් ඇති තැනකින් බැවින් අපි එම ප්‍රශ්නය කුමක්දැයි අර්ථදක්වා ගනිමින් කාර්යය පටන් ගත යුතුයි.



අපේ ප්‍රශ්නය අර්ථදක්වා ගැනීම වඩාත් නිශ්චිත වන තරමට, පරිවර්තනයක් ඇති කළ යුතු ආකාරය හඳුනා ගැනීම පහසු වෙනවා. එම නිසා, මෙතැන තිබෙන ප්‍රශ්නය 'නොරිස්සීම' යැයි නොකියා අපිට 'ළමයින්ට අනෙක් ආගමික ප්‍රජාවන්ට අයත් මිතුරන් නොමැතිවීම' යැයි කිව හැක. එය, අඛණ්ඩව සිදුවෙමින් පවතින නොරිස්සීමෙහි ප්‍රතිඵලයක් මෙන් ම එයට හේතුවක් ද වෙනවා.

---



මෙවැනි ප්‍රශ්නවලට පදනම සෑදීමට දායක වෙන විවිධ හේතු සාධක තිබෙනවා. එවැනි හේතු සාධක කිහිපයක් පහත දැක්වෙන ආකාරයේ ඒවා විය හැක:

- මිනිසුන් තුළ ඇති ප්‍රශ්නකාරී ආකල්ප,
- ප්‍රශ්නකාරී හැසිරීම්, එනම් මිනිසුන් කරන දේ,
- නැති නම් ප්‍රශ්නකාරී නීති රීති හෝ ප්‍රතිපත්ති.

මෙම ආකල්ප, හැසිරීම් සහ නීති රීති එක්වුනාම ප්‍රශ්නය නිර්මාණය වෙනවා. එම නිසා, අපි හඳුනාගෙන ඇති ප්‍රශ්නයට අදාළ වන, අප විසින් වෙනස්කර ගත යුතු, නැති නම් පරිවර්තනය කරගත යුතු ආකල්ප, හැසිරීම්, හෝ නීති රීති මොනවාද?

---




අපේ මේ උදාහරණයට අනුව අපිට සමහරවිට මෙහෙම කියන්න පුළුවන්: 'තමන්ගේ ළමයින්ට වෙනත් ආගම්වල යාළුවන් සිටීම ගැන මවුපියන්ට සෘණාත්මක ආකල්ප තිබෙනවා', නැති නම් 'වෙනස් ආගම්වල ළමයින්ට පාසලේ දී පීඩා කිරීම සම්බන්ධයෙන් පාසල කිසිත් නොකර එය ඉවසා සිටිනවා', එසේත් නැති නම් 'වෙනස් ආගම්වල ළමයින්ට යාළු මිත්‍රයින් විදියට ඉන්න අවසර දිය යුතු නැහැ කියා ප්‍රදේශයේ ආගමික නායකයින් කියනවා.' මේවා අපේ මේ ප්‍රශ්නයට දායක වන ආකල්ප, හැසිරීම් සහ නීති රීති.

## අපේ ගමනාන්තය



අපි පරිවර්තනයක් නැති නම් වෙනසක් ඇතිකිරීමේ ගමනක් යන විට, අපිට අවසානයේ දී යාමට අවශ්‍ය තැන දැනගෙන සිටීම වැදගත්! අපේ ගමනාන්තය නිර්වචනය කිරීම තරමක් සංකීර්ණ දෙයක්. අපි සියලු දෙනාට ම අවශ්‍ය සාමය, යුක්තිය සහ වෙනස්කොට නොසැලකීම කියන දේවල් වෙත ළඟා වීමටයි! එහෙත් අපි යම් කිසි කාල රාමුවක් තුළ අපට සාක්ෂාත් කරගන්න පුළුවන් මොනවාද කියන කාරණය ගැන සත්‍යවාදීව සහ යථාර්ථවාදීව සිතන්නට අවශ්‍යයි.


---



උදාහරණයක් විදිහට 'ළමයින්ට අනෙක් ආගමික ප්‍රජාවල මිතුරන් සිටියි' යන්න අපේ අරමුණ වෙන්න පුළුවන්. එම අරමුණට ළඟාවෙන්න, දැනට තියෙන අහිතකර ආකල්ප, හැසිරීම් හා නීතිරීති වෙනුවට අපි දකින්න කැමති කුමන විශේෂිත ආකල්ප, හැසිරීම් සහ නීතිරීති ද?


උදාහරණ ලෙස, 'අනෙක් ආගම්වල ළමයින් සමග මිතුරුවීමට මව්පියන් දරුවන්ව දිරිගන්වති' හෝ 'පාසලේ දී පීඩා කිරීම සම්බන්ධයෙන් පාසල සක්‍රියව ක්‍රියාත්මක වෙයි' හෝ 'ආගමික නායකයින් විවිධ ආගමික ප්‍රජාවල ළමයින් අතරේ මිත්‍රත්වය දිරිගන්වති' වැනි දෑ.

---




අපේ ප්‍රශ්න සහ අරමුණු හරියට කන්නාඩියකින් ඒ එක එකෙහි පෙනෙන රූපවලට සමාන බව දැන් ඔබට පෙනෙනවා ඇති. අපේ පරිවර්තන ගමනේ රාමුව අර්ථ දක්වන්නේ මේ ප්‍රශ්නය සහ අරමුණ මගිනුයි. මේ වෙනස නැතිනම් පරිවර්තනය ඇතිකරන ක්‍රියාවලිය ආරම්භ වන්නේ කොතැනින්ද? අපට එය රැගෙන යාමට අවශ්‍ය කරන්නේ කොතැනකටද?

## අතරමගදී අපට හමුවන මිනිසුන්



අපි දීර්ඝ ගමනක් යන අතරමගදී අපට විවිධ අය හමුවෙන්න පුළුවන්. අපි යන දිශාවට ම යන තවත් මගීන්, අපට ටිකට් තිබේදැයි පරීක්ෂා කර බලන ටිකට් පරීක්ෂකවරුන්, අපව නවත්වන හෝ වෙනත් මගකට යොමු කරන මාර්ග බාධක ඇතිකරන අය මෙසේ අපට හමුවන පුද්ගලයින් අතර ඉන්නවා. ඉතින්, ඒ විදියට අපට අතරමගදී හමුවෙන්නේ කවුද?




ඒ අය අතර මෙවැනි පුද්ගලයින් ඉඳීවි:

- ප්‍රශ්නයෙන් පීඩාවට පත්වුණ අය (අපේ උදාහරණයේ නම්, ළමයින්)
- මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් යමක් කිරීමට බලය ඇති අය (උදාහරණ ලෙස පාසලේ පරිපාලනය සහ ගුරුවරුන්, ආගමික නායකයින්).




ඒ වගේම පහත සඳහන් ආකාරයේ පුද්ගලයිනුත් සිටින්න පුළුවන්:

- අපේ අරමුණට ම යන, මෙම ගමන අතරතුර අපට උදව් කළ හැකි තවත් අප වැනි ම මඟීන්. අපේ උදාහරණයේ දී ප්‍රාදේශීය අන්තර්-ආගමික කමිටු අපේ මිතුරන් විය හැකියි.
- එසේ නැති නම්, අපේ අරමුණට විරුද්ධ, අපේ ගමනට බාධා කරන අය. සමහර විට අපේ ප්‍රජාවේ ඉන්න, සමාජ මාධ්‍ය වලට බලපෑමක් ඇති කරන, අන්‍යයින් නොරුස්සන කෙනෙක් එයට උදාහරණයක් ලෙස දැක්විය හැකියි.




අපි ක්‍රියාකාරී සැලැස්මක් ලියන විට, මේ පුද්ගලයින්, සංවිධාන සහ ආයතන කවුදැයි සිතා බැලීම හොඳ දෙයක්. එවිට අපි උපක්‍රම තෝරාගෙන අපේ ක්‍රියාමාර්ග සැලසුම් කරන විට අපට ඒ අය ගැන සිතේ තබාගෙන කටයුතු කරන්න පුළුවන්.
පරිවර්තනය සිදු කිරීම සඳහා අපට උපකාර කළ හැක්කේ කාටද? අපි ඒත්තු ගැන්විය යුත්තේ කාවද – සහ කුමක් පිළිබඳවද? පරිවර්තනයක් සිදුකිරීමේ ගමන අතර මැද බාධා කරනු ලැබීමට ඉඩ තිබෙන්නේ කවුරුන් විසින්ද?

## මාර්ගය තෝරාගැනීම




සාමාන්‍යයෙන් එක් තැනක සිට තවත් තැනකට යාම සඳහා විවිධ ක්‍රම කිහිපයක් තිබිය හැකියි. ඒ කියන්නේ විවිධ මාර්ග වාගේම විවිධ ප්‍රවාහන ක්‍රම තියෙන්න පුළුවන්. ඉතින් අපි ගන්නේ ඒ කුමන මාර්ගයද?


අපේ මාර්ගය තීරණය වෙන්නේ අපි යොදාගන්නා උපක්‍රම අනුවයි. දැනුවත්භාවය වර්ධනය කිරීමේ සිට පක්ෂව පෙනී සිටීම සහ උල්ලංඝන ලේඛනගත කිරීම දක්වා අපිට තෝරාගැනීමට විවිධ උපක්‍රම 15 ක් තිබෙන බව මතක තබා ගන්න. අපි දැනටමත් මෙම උපක්‍රම යොදා ගැනීම සඳහා වන ක්‍රියාත්මකවීම සඳහා අදහස් විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබෙනවා! දැන් ඔබට ඒවා භාවිතා කළ හැකියි!



අපගේ උදාහරණ ලෙස, අපි අන්තර් ආගමික පාපන්දු කණ්ඩායමක් නිර්මාණය කර ළමයින්ගේ මනස තුළ පරිවර්තනයක් ඇතිකිරීමට අවධානය යොමු කරනවාද, නැත හොත්, පීඩා කිරීම් සිදුවූ අවස්ථා ලේඛනගත කර ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්නා ලෙස පාසලේ පරිපාලනයෙන් ඉල්ලා සිටීම ගැන අවධානය යොමු කරනවාද? නැත හොත් වඩාත් ම හොඳින් විවිධත්වය ප්‍රවර්ධනය කරමින්, පන්ති කාමරය තුළ සියලු දෙනාට ම ගරුකිරීම සහතික කරන ගුරුවරයා සඳහා විශේෂ සම්මානයක් සූදානම් කර, ධනාත්මක සම්බන්ධතා ප්‍රවර්ධනය කරන ගුරුවරුන්ට දිරිගැන්වීම් ලබාදීම කෙරෙහි අවධානය යොමු කරනවාද? නැතිනම්, අන්තර් ආගමික මිත්‍රත්ව දිරිගැන්වීම සඳහා ආගමික නායකයින්ව පෙළඹවීම පිළිබඳ සිතා බලනවාද? එසේත් නැත හොත් මෙම ක්‍රියාමාර්ගවල සම්මිශ්‍රණයක් යොදා ගන්නවාද?


අපිට කළ හැකි විවිධාකාර දේ බොහෝ තිබෙනවා. අපිට ඒ සියල්ල ම කළ නොහැකියි, නමුත් මෙහිදී අපිට සාර්ථකත්වයක් ලබාගැනීමට නම් එකකට වඩා වැඩි ක්‍රියාමාර්ග සංඛ්‍යාවක් ගැනීමට සිදුවේවි. උදාහරණයක් ලෙස ප්‍රධාන ආගමික නායකයින් පාපන්දු කණ්ඩායමට විරුද්ධ වන්නේ නම්, සහ පාපන්දු කණ්ඩායමට බැඳීමට කිසිවෙක් නිර්භයව ඉදිරිපත් නොවන්නේ නම් පාපන්දු කණ්ඩායමක් ආරම්භ කිරීම පළක් නැති ක්‍රියාවක් වෙන්න පුළුවන්. සාර්ථක ක්‍රියාකාරී සැලැස්මක සාමාන්‍යයෙන් එකිනෙකට වෙනස්, එහෙත් එකිනෙක ඌනපූරණය කරන උපක්‍රම කිහිපයක එකතුවක් අඩංගු වෙනවා.

## ගමනේ පියවර




භාවිතා කරන්නේ කවර උපක්‍රම දැයි තීරණය කළ පසු අපි ඒවා භාවිතා කරන්නේ කෙසේද යන්න සිතා බැලිය යුතුය. අපි ගත යුතු ප්‍රත්‍යක්ෂ පියවර මොනවාද, සහ ඒවා ගත යුතු අනුපිළිවෙල කුමක්ද? අපි තෝරාගෙන ඇති එක් එක් උපක්‍රමයට අදාළව කවුරුන් විසින් කුමන වේලාවක කුමන කාර්යයක් කරනවාද? අපි පාපන්දු කණ්ඩායම සංවිධානය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම හෝ සමීක්ෂණයක් පැවැත්වීම සඳහා ප්‍රායෝගිකව කටයුතු කරන්නේ කොහොමද? ආගමික නායකයින් සමග කථා කරන්නේ කවුද? ඒ කුමන ආගමික නායකයින් සමගද?

## පණිවුඩය





අපි මිනිසුන්ට කථා කරන විට අපි ඔවුන්ට කියන්නේ මොනවා දැයි සිතා බැලිය යුතුයි. අප සමග සම්බන්ධ වීමට අපේ මිතුරන් කරගත හැකි අයව ඒත්තු ගැන්වීම හෝ තමන්ගේ ආකල්ප හෝ හැසිරීම් වෙනස් කරගැනීම සඳහා මිනිසුන්ව ඒත්තු ගැන්වීම සිදු කළ හැක්කේ කවර ආකාරයේ තොරතුරු හෝ තර්ක මගින්ද? විරුද්ධත්වයන් එල්ලවීම වැළැක්වෙන ආකාරයෙන් අපගේ පණිවුඩය සකස් කළ හැකි ක්‍රම තිබෙනවාද?

උදාහරණයක් ලෙස, විවිධ ප්‍රජාවන් සමග සම්බන්ධතා ගොඩනගා ගැනීම තම දරුවන්ගේ අනාගතයට කෙතරම් ප්‍රයෝජනවත් වන්නේද යන්න පිළිබඳ තොරතුරු මෙන් ම පාපන්දු කණ්ඩායමේ දී තම දරුවන් සුරක්ෂිත බව සහ ඔවුන්ව හොඳින් රැක බලාගන්නා බව සහතික කරන ප්‍රායෝගික තොරතුරු දෙමව්පියන්ට අවශ්‍ය විය හැකියි.

අපි පාපන්දු කණ්ඩායම මෙහෙයවීම සඳහා විවිධ ආගමික ප්‍රජාවන්ට අයත් වැඩිහිටියන් සම්බන්ධ කරගන්නේ කෙසේද යන්න දැනගැනීමට ප්‍රාදේශීය අන්තර් ආගමික සභාව උනන්දුවක් දක්වනු ඇත.

ළමයින්ට පීඩා කිරීමට එරෙහි ප්‍රතිපත්තියක් තිබීම පාසලේ පැතිකඩ වැඩිදියුණු කිරීම සඳහා යොදා ගත හැක්කේ කෙසේ දැයි ඇසීම මගින් පාසලේ පරිපාලනය දිරිමත් විය හැකියි.

## බාධක සහ අවදානම්





දීර්ඝ සහ දුෂ්කර ගමනක දී මගීන්ට විවිධ බාධක, අන්තරායන්, සහ කුණාටු වලට මුහුණ දීමට සිදු විය හැකියි. එහෙත් තමන්ගේ ගමනාන්තයට ළඟාවීමට නම් ඔවුන් ඒවා මගහරිමින් හෝ මැඩපවත්වා ගනිමින් ඉදිරියට යා යුතු යි. සියලු ම පරිවර්තන ක්‍රියාවලීන්ට බාධක සහ අවදානම් ද ඇතුළත් වෙනවා. අපි ඉදිරිය ගැන සිතා හැකිතාක් සුරක්ෂිත මාර්ගයක් තෝරා ගන්නේ නම් සහ මතු විය හැකි විවිධ තත්වයන්ට මුහුණ දෙන ආකාරය සැලසුම් කරන්නේ නම් අපට එය ප්‍රයෝජනවත් වෙනවා.

ඉතින්, අපි ගන්නට අදහස් කරන ක්‍රියාමාර්ග ගත හොත් අපට මුහුණ දෙන්නට සිදු වන බාධක සහ අවදානම් මොනවාද? මෙම ක්‍රියාමාර්ග අතරින් කවරක් හෝ අතිශය අවදානම් සහිතද? අපිට අවදානම අවම කරගත හැකි ක්‍රම තිබෙනවාද?

උදාහරණ ලෙසඃ ඇතැම් පසුබිම් තුළ, අන්තර් ආගමික පාපන්දු කණ්ඩායම පිළිබඳ ප්‍රාදේශීය ගුවන් විදුලියෙන් ප්‍රචාරය කිරීම එවැනි දේ නොරුස්සන යම් යම් කණ්ඩායම්වල අවධානය එයට යොමු වී එම කටයුතු වලට එරෙහිව විරෝධතා සංවිධානය කිරීමට හේතු විය හැකියි. නිහඬව එම කාර්යය ආරම්භ කර ක්‍රමයෙන් මහජන සහාය ලබා ගැනීමට අපට සිදුවිය හැකියි.

## සමාප්තිය



අපි දැන් ක්‍රියාකාරී සැලැස්මක් සාදා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ කථා කර අවසන්. අපගේ පරිවර්තන ගමන සඳහා පහත සඳහන් දේ අවශ්‍ය බව අපි දැන් දන්නවාඃ

- ආරම්භක ස්ථානයක් – අපගේ ප්‍රශ්නය
- ගමනාන්තයක් – අපගේ අරමුණ
- අතරමගදී අපට හමුවන අය – මිතුරන්, විරුද්ධවාදීන් සහ අපිට යම් ආකාරයකින් බලපෑමක් කිරීමට අවශ්‍ය අය
- මාර්ගය – අපි භාවිතා කරන්නට යන උපක්‍රම සහ ඉදිරියට යාම සඳහා අපි ගත යුතු ශක්තිමත් පියවර
- අපි ලබා දෙන පණිවුඩය පිළිබඳව සහ අතරමගදී අපිට මුහුණ දීමට සිදුවිය හැකි අවදානම් පිළිබඳවත් අපි සිතා බැලුවා.

ඔබට භාවිතා කිරීමට අවශ්‍ය ඕනෑම වර්ගයක උපක්‍රමයක් සඳහා සරල හෝ ගැඹුරු ක්‍රියාකාරී සැලසුම් සාදා ගැනීමට මෙම ක්‍රියාවලිය භාවිතා කරන්න ඔබට පුළුවන්.

ඉතින්, ඔබ ක්‍රියාත්මක වීමට කැමති ප්‍රශ්නයක් සම්බන්ධයෙන් පරිවර්තන ගමනක් යාම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරගනිමින් ඔබ විසින් ම මෙය ක්‍රියාත්මක කර බැලීමේ අවස්ථාව පැමිණ ඇත!